# කොවිඩ් - 19 මානුෂීය අර්බුධය සඳහා සන්නාම විසින් ගන්නා වගකීම්: ඇඟළුම් ශ්‍රමිකයන්ගේ සහනය සඳහා දායකත්වය.

අප්‍රේල් 2020

## I. ඇඟළුම් ශ්‍රමිකයන්ගේ සහනය සඳහා කොවිඩ් - 19 මානුෂීය අර්බුධය

කොවිඩ් - 19 වසංගතය ගෝලීය වශයෙන් පැතිරයාම සිදුවන අතරතුර ගෝලීයව නිම් ඇඳුම් වැඩියෙන්ම නිෂ්පාදනය කරන ආසියාතික ඇඟළුම් ශ්‍රමිකයන් ඉතා දුෂ්කර තත්වයට පත් වී තිබේ. මෙම තත්වය යටතේ දැඩි අවධානම්, දරිද්‍ර කාර්‍ය හා ජීවන තත්වය සිටින ශ්‍රමිකයන් මෙවැනි විශාල ව්‍යසනයන්ට මුහුණ දීමේ අවම සූදනම් ඇති අය වේ. එම නිසා ආචාරධර්මය ඔවුන් මුහුණ දී ඇති මානුෂීය අර්බුධය සඳහා ප්‍රතිචාර දීම අත්‍යවශ්‍ය වේ. ඔවුන් වසර පුරා මහත් වූ ලාභ උපයන ගෝලීය විලාසිතා කර්මාන්තයේ නිපදවන්නන් වූවද තවමත් දුප්පත්කමෙන් ගිලී සිටි.

ආසියාතික බිම් වැටුප් සංධානය (AFWA) මෙම අර්බුධයේ පරිමාණය තේරුම් ගැනීම සඳහා ආසියාතික ඇඟළුම් නිෂ්පාදනය කරන රටවල වෘත්තීය සමිති හවුල්කරුවන් සමඟ කටයුතු කරමින් ඇත. අප සාගින්නෙන් පෙලීමට යන පවුල්, නිවස රහිත වීමට යන, රෝගී සහ සුවසේවා සඳහා ඇතුල්විය නොහැකි සහ බලාපොරොත්තු සුන්වීම දෑස් දල්වා බලා සිටින සේවකයන් දනිමු.

බොහෝ ශ්‍රමිකයින් සංක්‍රමණිකයින් වන අතර මෙවැනි දුෂ්කර සමයක ඔවුන්ට ආධාරක පද්ධතියක් නොමැති වේ. සේවකයින් සඳහා බහුකාර්ය, කෙටි සහ දිගු කාලීන මැදිහත් වීම් අවශ්‍ය වේ. මෙම අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීමට විවිධ රටවල ශ්‍රමිකයින් සහ වෘත්තිය ඉදිරිපත් කරමින් සිටී.

## II. ඇඟළුම් ශ්‍රමිකයන්ගේ මානුෂීය අර්බුධය උදෙසා සන්නාමයන්ගේ වගකීම.

විලාසිතා නිෂ්පාදනය ඇඟළුම් සේවකයන්ගේ සුභසාධනය සඳහා දායකවීම සහ තීරණ ගැනීම සඳහා රජයන් සහ නිෂ්පාදිත කර්මාන්තශාලාවලට අමතරව ඉක්මන් විලාසිතා කර්මාන්තයේ නියුතු සන්නාම සහ වෙළෙන්දන් ඉතා සුවිශේෂී භූමිකාවක් නිරූපණය කරයි. ගෝලීය සැපයුම් දාමයේ මිලියන 40 වඩා වන ආසියාවේ 60% වන ඇඟළුම් නිෂ්පාදනයේ නියුතු සේවකයින් මුහුණදී ඇති අතිශයින් පීඩාකාරී තත්වය සමනය කිරීමට සන්නාමයන් දායකත්වය දැක්වීම අත්‍යවශ්‍ය වේ.

සැපයුම් දාමය සඳහා සන්නාමයන්ගේ වගකීම වනාහී දිගුකාලීන මෙන්ම බහුමානීය ගැටළුවකි. සන්නාම ගෝලීය සැපයුම් දාමයේ හිමිකරුවන් සහ තීරණ ගන්නන් වේ. සැපයුම්කරුවන් තද පර්යන්තයන් වෙනුවෙන් නිෂ්පාදිත හැනියාව කැපකර ඇත්තේ නියමිත වෙලාවට සැපයුම් ලබාදෙන සබඳතා සඳහාය. එම නිසා ජාතික රාජ්‍ය තුළවූ අධිකරණ නියමයන් මගින් වන අවධානම සන්නාම මගින් පිටත මූලාශ්‍ර ගතකර ඇත. එනමුත් ILO, OECD සහ පුළුල් කාර්මික සහ කම්කරු අයිතීන් ව්‍යාපාරය විසින් බලකර සිටින්නේ සන්නාමයන් ඔවුන්ගේ සැපයුම් දාමයට යථායෝගීව බැඳීසිටින අතර ඒ හා සම්බන්ධ අවධානම් සඳහා වගකීම දැරිය යුතු බව ප්‍රකාශ කිරීම අප දැක ඇත්තෙමු. වර්ථමාන අර්බුධය සැපයුම් දාමයේ සිදුවිය යුතු සුවිශේෂී ප්‍රතිසංසකරණ නිරාවරණය කරන අතර එහිදී සන්නාමයන් විසින් සැපයුම් දාමයේ ඇති අවධානම් සඳහා සන්නාමයන් වගකීම් දැරීම වන අනිවාර්‍ය වෙනස්කම් ඇතුලත් විය යුතුය.

2020 මාර්තු 23 දින, කොවිඩ් - 19 මගින් ඇගළුම් ශ්‍රමිකයන් මත වන බලපෑම සමනය කිරීම සඳහා සන්නාම විසින් විශේෂ සහන දායකත්වයක් දැක්වීම සඳහා මානුෂීය සහ හදිසි අර්බුධ ප්‍රතිචාර දැක්වීමක් කළයුතු බවට AFWA විසින් ප්‍රකාශයක් නිකුත් කරන ලදි. මේ මොහොතේ සන්නාම වෙත අප කරන ඉල්ලීම් පහත සවිස්තරාත්මකව යෝජිත දළ සටහන දක්වා ඇත.

## III. සැපයුම් දාමයේ ශ්‍රමිකයන් වෙත සන්නාම විසින් වාර්ෂික මූල්‍ය මූලාශ්‍රවලින් 2% ක්ෂණික සහන සඳහා නිකුත් කිරීම

අප්‍රමාදීව තත්වය යටතේ ආසියාතික බිම් මට්ටමේ සංධානය යෝජනා කරනුයේ වහාම රැකියා නැවැත්වීම නිසාවූ ආදායම් අහිමිවීම සඳහා ප්‍රතිකර්ම යෙදිය යුතු බවය. එම ආදායම් අහිමිවීම නිරෝධායනය, තොග ඇණවුම් අවලංගු කිරීම ආදී වූ විවිධ හේතුන්මත සිදුවී ඇත. වර්තමාන සැපයුම් දම ව්‍යුහයේ අවම අවධානමක් ඇති වැඩිම ලාභ උපයන ගෝලීය සන්නාම, රජයන් සහ සැපයුම්කරුවන් ප්‍රතිරක්ෂණය සහ ඔවුන්ගේ උත්සහයන්ට සහයෝගය දැක්විය යුතුය.

AFWA යෝජනා කරන ක්‍රමවේදය වන්නේ විලාසිතා සන්නාම මගින් මෙම හදිසි මානුෂීය අර්බුධය සඳහා එක්වරක් ප්‍රමාණවත් වන සන්නාම - සැපයුම් දාම සහන දායකත්වයක් (SRC) දැක්වීමය. එමඟින් සැපයුම් දාමයේ වැඩිකොටසක් කාන්තාවන් වන ශ්‍රමිකයන් මත බලපා ඇති කොවිඩ් - 19 නිසාවන අහිතකර බලපෑම් ස්වල්ප වශයෙන් අවමකිරීම සඳහා කටයුතු කළ හැක.

මෙම එක්වරක් පමණක්වන සන්නාම දායකත්වය, AFWA මගින් ගණනය කර ඇත්තේ සන්නාමයේ පරිමාණය සහ ආසියාව පුරා එහි සැපයුම් කර්මාන්ත කරුවන්ගේ ප්‍රමාණය මතවූ ක්‍රමවේදයක් මතය. 2020 ජූනි මසින් අවසන්වන කාලයට ශ්‍රමිකයෙකුගේ අහිමිවන වැටුප් සාමාන්‍ය දින 60 සඳහා ගණනය කර, අප යෝජනා කරන්නේ සන්නාම විසින් වරක් පමණක් වන සැපයුම් දාම සහන දායකත්වය එම සන්නාමයේ සිටින සියළු කර්මාන්තශාලාවල වූ අනිවාර්‍ය අංගයක් වේ.

වර්තමානයේ පවතින ශ්‍රම වියදම මතවූ දත්ත පදනම්කර ගෙන පෙර වර්ෂයේදී අදාළ කර්මාන්තශාලාවකින් සිදුවූ පූර්ණ මූලාශ්‍ර වලින් (අදාළ සන්නාමය සඳහා වූ) අතිරේක 2%ක ප්‍රමාණයක්

සැපයුම්දාම සහන දායකත්වය ගණන්කිරීමට සන්නාම යොදාගත යුතු බව යෝජනා කරන්නාවූ මෙම SRC ස්ථාපිත කළ යුත්තේ සන්නාමයගෙන් නිෂ්පාදකයන් හරහා සෘජුවම සේවකයින්ට ලැබෙන පරිදි වන අතර සන්නාම මෙම ගෙවීම් සඳහා දයකත්වය සැපයිය හොත් සැපයුම් කර්මාන්තශාලාවල සිටින එක් එක් සේවකයින්ට වැදගත් සහ අවශ්‍යතාවලට සරිලන දායකත්වයක් ලැබීම තුලින් කොවිඩ් - 19 නිසාවන දැඩි බලපෑම්වලින් සහනයක් ලබාගැනීමට හැකිය.

AFWA විසින් ගෝලීය කම්කරු සහ මානව අයිතිවාසිකම් සංවිධාන, වෘත්තිය සමිති සහ සැපයුම්කරුවන් සඳහා සන්නාමයන් ඔවුන්ගේ දිගුකාලීන කැපවීම සහ නිත්‍යානුකූල බැඳීසිටීම්වලට ගරුකරන ලෙස කරන ඉල්ලීම සඳහා සහයෝගය සහ ශක්තිමත් කිරීම සිදුකරයි. මෙම SRC සහන දායකත්වයක් පමණක්වන අතර එය සන්නාමයන් මත පැවරී ඇති වර්තමාන සහ දැනුම පවතින සැපයුම්දාම වගකීම් සහ නිෂ්පාදිත ඇනවුම් සඳහා ගෙවීම, දෙන ලද ඇණවුම් ප්‍රතික්ෂේප කිරීම, නිෂ්පාදන සඳහා වට්ටම් ඉල්ලීම, දැනටමත් වියදම් සිදු වී ඇති සැපයුම් දාමය මත නොකිරීම සඳහා විකල්පයක් නොවිය යුතුය.

## IV. සන්නාමයන්ගෙන් ලැබෙන දායකත්වය ශ්‍රමිකයින් වෙත ලඟා වීම සහතික කිරීම.

බොහෝ රටවල් මහජනයාගේ සහ වෙළඳ ප්‍රජාවගේ කැමැත්තට සරිලන ලෙස නීතිමය ක්‍රියාදාමයන් සහ ප්‍රතිපත්ති සැකසීම සිදුකරමින් පවතී. අර්බුධයට සහය සඳහා අන්තර්ජාතික මූල්‍ය ආයතනයන්හි දියකත්වයද ගෙන ඇත. AFWA ඉතා හොඳින් ඇඟළුම් නිෂ්පාදනය කරන ආසියාතික රටවල් නිරීක්ෂණය සහ අධීක්ෂණය කරමින් සිටින්නේ ඉදිරි මාස වලදී එම රජයන් සහ නිෂ්පාදකයින් කෙසේ ඔවුන්ගේ වගකීම් සහ වගවීම් වලට ගරුකරන ආකාරය සඳහායි.

මෙවැනි ක්‍රියාවලින් පමණක් නොව, අප බලකර සිටින්නේ සන්නාම විසින් සහන දායකත්වය මෙහි දැක්වූ පරිදි කළයුතු බවය. එය මෙම රටවල පවතින අත්‍යවශ්‍ය දුර්වලතා සමනය කිරීමට ඉතා වැදගත් පිටුවහලක් වනු ඇත.

සන්නාම මගින් පවත්වා ගෙන යන ගෝලීය සැපයුම් දාමයේ පවතින අවධානම් සහ අසමානතා වර්තමාන අර්බුධය හමුවේ නිරාවරණය වී ඇති විටක - AFWA මෙහිදී යෝජනා කරණුයේ සෑම සන්නාමයක්ම

- වහාම සැපයුම්දාම සහන දායකත්වය (SRC) නිවේදනය කිරීම; එය පෙර වර්‍ෂයේ සෑම නිෂ්පාදිත රටකම පවතින සැපයුම් කර්මාන්තශාලාවලින් ලබාගත් පූර්ණ මූලාශ්‍රවලින් 2% එම සැපයුම්දාම සහන දායකත්වය සඳහා යෙදවේ.
- AFWA සහ අදාල රටවල සිටින එහි සාමාජික වෘත්තිය සමිති සහ සහයෝග දක්වන ආයතන සමඟ එක්වීම මෙන්ම නිෂ්පාදකයින් සමඟ එක්ව ක්‍රියාකිරීම මගින් සැපයුම්දාම සහන දායකත්වය සියළු සුදුසුකම්ලත් සේවකයින්ට ලඟාවන බව සහතිකකිරීම සහ එය සම් බලාත්මක ක්‍රියාවලින් දක්වා පරිණාමය කිරීමටය.

අනුමත කිරීම පහත සඳහන් වෘත්තිය සමිති මගිනි.

කාම්බෝජ වෘත්තිය සමිති සංධානය (CATU)

කාම්බෝජ ඇගළුම් සේවකයන්ගේ ප්‍රජාතන්ත්‍ර සමිති සන්ධානය (CCAWDU)

ඇගළුම් ශ්‍රමික වෘත්තීය සමිතිය (GLU), ඉන්දියාව

කර්ණාටක ඇගළුම් සේවක වෘත්තීය සමිතිය (KOOGU), ඉන්දියාව

ඇගළුම් සහ එක්සත් සේවකයින්ගේ වෘත්තීය සමිතිය, ඉන්දියාව

මේස් ඇඳුම් සේවකයන්ගේ එකමුතු මධ්‍යස්ථානය, ඉන්දියාව

මිල් මැස්ඩොර් පංචායත් (MMP), ඉන්දියාව

තමිල්නාඩු රෙදිපිලි සහ පොදු කම්කරු සංධානය (TTCU), ඉන්දියාව

සෙරිකාත් පෙකර්ණ නැසනල් (SPN), ඉන්දුනිසියාව

පෙඩරාසි සෙරිකත් බෘහුගාමෙන්, කෙරන්ජේන්, ටෙක්සිල්, කුලින් ඩාන් සෙන්ටා ඉන්දුසි (FSB ගාටෙක්ස්), ඉන්දුනිසියාව

ගබුන්ගන් සෙරිකත් බෘහු ඉන්දුනිසියාව (GSBI)

පෙඩරාසි සෙරිකත් බෘහු ඉන්දුනිසියාව (FSBI)

සෙරිකත් බෘහු සෙජාටෙරා ඉන්දුනිසියාව (SBSI)

ජාතික වෘත්තිය සමිති එකමුතුව (NTUF), පාකිස්ථානය

සිලොන් වෙළඳ, කාර්මික සහ සාමාන්‍ය සේවකයන්ගේ වෘත්තිය සමිතිය, ශ්‍රී ලංකාව (CMU)

රෙදිපිළි, ඇගළුම් සහ නිමි ඇඳුම් සේවකයන්ගේ වෘත්තිය සමිතිය (TGCWU), ශ්‍රී ලංකාව

දාබිදු වෘත්තිය සමිති සංධානය, ශ්‍රී ලංකාව

නැව්කරුවන්ගේ ජාතික වෘත්තිය සමිතිය, ශ්‍රී ලංකාව

එක්සත් කම්කරු පෙරමුණ (ULF), ශ්‍රී ලංකාව